# ගිලන් නොවූ සෙනෙහස

**රුවිනි සමරනායක**

යෞවනයේ මා තනිව මියෙද්දී
ඔබ මට තරුවක් වී ආවා
අතැඟිලි බැඳි දා සැවොම හඬද්දී
අපි දුරු රටකට ඉගිල ගියා

ආදරයේ සුව පහස විඳිද්දී
සුදු පුතු අපෙ ලොව එළිය කළා
ඒ ලොව සුරතල් බලනා අතරේ
චූටි දුවත් දෝතට ආවා

කැදැල්ලෙ අපි සුව විඳිනා කාලෙදි
ඔබ අසරණ වී ගිලන් උනා
දූද පුතුද මා අද අසරණ වී
බුදු පා මුල සරණක් සෙව්වා

ඔබ සුව නින්දේ සැතපෙන විටදී
සිහිනෙන් තනිවම සුසුම් හෙලා
දුවගෙත් පුතුගෙත් උණුසුම මැද්දේ
මාද තනිව සුසුමන් හෙලූවා

කරදර සියල්ල මා වෙත ගත්තේ
ඔබගේ මනසට සුව ලැබ දෙන්නයි
මගෙ හිත ගැන ඔබ කෙසේ සිතූවත්
ඔබට පිදූ පෙම එදා වගේමයි

බුදු හිමි පාමුල නෙළුමක් පුදලා
පතමුද ඔබ හට සුව දෙන්න කියා
ඒ සුබ පැතුමේ සුවඳ දරාගෙන
සැමදා හිඳිමූ සැනසීලා

# පොසොන් අසිරිය

**ජයසේන කොඩිතුවක්කු**



විහිදෙන සඳ එළිය සිසිලස    බෙදා දෙන
පැතිරෙණ මඳ සුළඟ දාහය    නිවා ලන
හිනැහෙන තුරු ලතා පොද වැසි    නිසාවෙන
එළැඹෙන පොසොන් දින සමරමු    බැති සිතින

මිනිසුන් එදා ගස් ගල් වැඳ    පුදාගෙන
අරසුන් ගති සිරිත් සිත තුළ    පොරෝගෙන
මැඩියන් ලෙසින් ළිඳ තුළ    සිරවී සිටින
දහමින් මිහිඳු හිමි සැනසුම    ලැබුව දින

විමසුව අඹ පැනය අනුබුදු    හිමි රජුගෙන්
නොඅඩුව තියෙන බව දැනගති    නුවණ එයින්
පැවසුව දහම් මග පිළිගෙන    හිස් මුදුනින්
ලක්දිව කළා පූජා බුදු    සසුන නමින්

පූජා බිමක් විය අනුරාපුර    පෙදෙස
පෝදා පොසොන් පැතිරෙනවා    දහම් රස
හැරදා ගිහි ගෙදර අටසිල් ගත්    පිරිස
පහදා යොමු කරති තම සිත නිවන    ලෙස

ජන හදවතේ යහගුණ බිජු    වැපිරෙව්වා
සම්මා ආජීවයට නිසි මග හුරු    කෙරුවා
නිවහල් රටක් ලෙස සිරිලක නම්    දැරුවා
සදහම් දීපයයි විරුදාවලි    ලැබුවා

# මගහැරුණ සෙවණැලි

**විසල් සේනාතිලක**

මා සතුව පැවති ප්‍රේමයේ
අගසවි දෙනම හැර ගොසිනි,
කාගේදැයි නමක් නැති කළුළක
හැඩය ගත් ක්ෂුද්‍ර දිවයිනක
හුදකලාවෙන් පසුවෙමි,
කැලැන්ඩර් කොළ
ගලව ගලවා විසිකරමි¤

ස්කයිප් කවුළුවෙන් එබෙන
අංගරාග තැවරුණ මුහුණකි,
අම්මාට කොහොමදැයි විමසන
නොසැලකිලිමත් මද සුසුමකි,
වැඩ අධික බව සැලකරන
නොරිස්සුම් සහගත මතුව
වරින් වර පිටකරන කැස්සකි,
මම ,
ඔහේ බලාගෙන ,
නො හෙලාම ඇසිපිය,
එබිඑබී ඒ විසල් දෑසට,
සොයන්නෙමි
පොඩි දුවගේ
මගහැරුණ සෙවණැලි

මසකට වරක් හැ වෙන,
මහළු දුරකතනයකි,
ගොරගොර ගගා අමතන
ඒ පිරිමි කටහ
ලොකු පුතාගේ බව අඳුනමි,
මහගෙදර නංගිටද ඔහුට දැයි පැනයකි,
පහළ කුඹුරු කාටදැයි සැකයකි,
මම,
සියුම් රිදුමක් ඇනි ඇනි
වේදනා දෙන හදවත
පසෙකින් ගලවා තබමි,
රීසිවරය අතහරිමි¤

දොර උළුවස්ස ලග
කබ පෙරාගත් පූසියෙකි,
මූණ සෝදන්න මතක නැති,
පුරුපුරු ගාන්න අමතවකව ඇති



# දරුවනි

**ගාමිණි දසනායක**

අහස ඉල්ලා හඬන
පොළොව ඉල්ලා හඬන
දරුවන්ම නොවන් නුඹ

අහස තුළ ඇති දේ
පොළොව තුළ ඇති දේ
සොයා විමසා බලන
දරුවකුව වී නුඹ

එවන් දරුවන් අතින්
නිමැවුම්ව හෙට දිනය
වඩා යහපත් වනු ඇත

# සරිනි දිසානායකගේ "සිනාවී" දුෂ්මන්ත බුලත්සිංහල ගේ කැමරාවෙන්



සන්නස මැයි කළාපයේ පළවූ " සිනාවී" ලිපිය සමග පළ වූ පහතින් නැවත පළවන සියළුම සේයා රූ දුෂ්මන්ත බුලත්සිංහල මහතාගේ බව කරුණාවෙන් සළකන්න. ඒ සේයා රූ සමග ඒ මහතාගේ නම සඳහන් නොවීම පිළිබඳව අපේ බලවත් කණගාටුව ප්‍රකාශ කරමු.

මේ සේයා රූ අප වෙත එවන ලද්දේ සිසිර දිසානායක මහතා විසින් බව කරුණාවෙන් සළකන්න.







